


මාසයක් කියන්නෙ කොපමණ දිග කාලයක් ද? හැමෝම කියන්නේ දවස් ගත වෙනවා තේරෙන්නෙවත් නෑ කියලා. ගිය අවුරුද්දේ සීත සෘතුව තිබුණේ ඊයෙ පෙරේදා වගෙයි. හිස ගිණි ගත්තා වගේ මුදල් ම හොයාගෙන යන ගමනට ඇති ඇල්ම නිසා අපට කාලය ගතවෙන එක ගැන හැඟීමක් නැහැ. සමහරු මේකට ජීවන අරගලය කියලා කියනවා. ඒක නම් හිනා යන කතාවක්. ජීවන අරගල කොහෙද මෙහෙ..? ඒව තියෙන්නෙ තුන්වන ලෝකයේ අපේ රටවලනෙ. මෙහේ තියෙන්නේ එකිනෙකාට වඩා ඉහළින් ඉන්න කරන අරගලයක්.

නිකමට හිතන්න මාසයක් කියන්නෙ කොපමණ දිග කාලයක් ද? මේ කාලය තුළ අපට මොන තරම් දේ සිදුවෙනවද? ඇත්තටම අපි දන්නෙ මෙයින් කොපමණ සුළු ප්‍රමාණයක් ද? පසුගිය මාසේ හුඟක් දේ සිදු වුණා. ඒ සිදුවීම් ආවර්ජනය කරන-කොට දැනෙන්නෙ සියුම් දුකක්. මං කියන්නම්.. අහන්න. අපි අපේ කම ගැන මොන තරම් නම් ආඩම්බර වෙනවද..? කතා කරනවද? අපේ ඉතිහාසය සංස්කෘතිය, හැදියාව, ආගන්තුක සත්කාරයේ ඇති විශිෂ්ඨත්වය වගේ කී නොකී හැම දේ ගැනම ගෙදරදීත් සමාජයේදීත් අප කොපමණ කතා කරනවද? ඒත් ප්‍රායෝගික ජීවිතයෙදි ඇත්තටම ඒවට මුහුණ දෙන්න ගියහම අපි කතා කරන, කරපු දේවල් ඒ අයුරින්ම නැතත් හැකි පමණින්වත් ක්‍රියාත්මක කරනවාද කියන එක මට නම් ගැටළුවක්. ඒ වගේ අද්දැකීම් වලට වඩා රටක් වශයෙන් අපේම රටට විය යුතු යුතුකම් ගැන සැළකීමේ දී අප අතින් වන අඩුපාඩු කම්, මගහැරීම් වල ප්‍රතිඵලය නම් කණගාටුදායකයි.

සමහර විට ඔබ සියළු දෙනාම දන්නවා ඇති පසුගිය දා අප මව්බිමෙන් මෙහි පැමිණි දැල් පන්දු කණ්ඩායම ගැන. සෑම වසරකටම වරක් ඔවුන් මෙහි පැමිණෙනවා. ඇවිත් තරග කරලා යනවා.. දිනනවා.. පරදිනවා.. අපි හුඟ දෙනෙක් දන්නේ එපමණයි. ඔවුන්ට නවාතැන් සපයා ගැනීමට ගුවන් විදුලියෙන් කරන ඉල්ලීමත් ටිකක් පුරුදුයි. ඒත් මෙවර තමයි මට ඒ ගැන හරි



අද්දැකීමක් ලැබුණේ. සැබෑ ලෙසම අපි ඉන්නේ මොන තරම් පසුගාමී තැනකද කියලා දැනුණේ මෙවර පැමැණි කණ්ඩායම සමග මුසු වීමෙනුයි.

ඔවුනගේ පැමිණීමේ සිට සමුගැනීම දක්වා ඔවුන් සතුටින් ඉන්නා බව පෙනුණත් ඒ

**මෙහි පැමිණීමට ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සඳහා ලිස්ට් එකක් හදාගෙන තමන්ගෙ ගමේ, නගරයේ, වෙළඳ සල් කරා යමින් මුදල් එකතු කර මෙහි පැමිණි දරුවන් ද ඒ අතර සිටියා. ඔවුන් අප ගැන මොනවා හිතනවා ඇද්ද?**

යටින් ඇත්තේ දුක්බර කතාවක්.

ක්‍රීඩාව , නිරෝගී, විනය ගරුක, සමාජශීලී මනා පෞරුෂයකින් යුත් පරපුරක් බිහිකිරී-මෙහි ලා ඉගා වැදගත් සාධකයක්. පාසල් මට්ටමේ ඉඳලා ක්‍රීඩාවට දක්ෂ අයගේ හැකියාවන් හඳුනාගෙන ඔවුන් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන් බවට පත් කිරීම අරමුණු කරගත් පුහුණු වැඩ සටහන් හා පුහුණු කරුවන් ඔවුනට ලබාදිය යුතුයි. ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැක බලා ගැනීම රක්ෂණය කිරීම ඔවුනට අවශ්‍ය මූල්‍ය හා භෞතික පහසුකම් ලබාදීම රජය මගින් කළ යුතු, දෙයක්. අපේ රටේ රජය හෝ ක්‍රීඩා අමාත්‍යාංශයේ යුතුකම් ගැන කතා කිරීම නිශ්ඵල දෙයක්. ඒක අමතක කරමු. තමන්ගේම වියදමින් අපේ මව්බිම නියෙ-ර්ජනය කිරීමට පැමිණෙන මේ දරුවන් ට මේ රටේදී අපි අපේ යුතුකම් ඉටු කරනවද? හැකියාව හොඳටම තිබියදීත්. දහසක් කරදර බාධක මැද මෙහි පැමිණෙන ඔවුනට නවාතැන් දෙන්නට රැක බලා ගන්නට සැම විටම ඉදිරිපත් වන්නේ සීමිත එකම කොටසක් පමණයි. අඩුම වශයෙන් ඔවුන් ක්‍රීඩා කරනු බලන්නට හෝ ඔවුන් දිරිමත් කරන්නට වත් පැමිණෙන්නේ අපෙන් කීයෙන් කී දෙනා ද? ටික දෙනෙක් හෝ විදේශ රටකදී තමන් වෙනුවෙන් නගන ඔල්වරසන් හඬ ඒ ක්‍රීඩිකාවනට ලොකු ශක්තියක් ධෛර්යයක් බව අපට වටහාගන්න බැරි ඇයි.

මෙහි පැමිණීමට ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සඳහා ලිස්ට් එකක් හදාගෙන තමන්ගෙ ගමේ, නගරයේ, වෙළඳ සල් කරා යමින් මුදල් එකතු කර මෙහි පැමිණි දරු-වන් ද ඒ අතර සිටියා. ඔවුන් අප ගැන මොනවා හිතනවා ඇද්ද? අවංකවම අපට මේවට මුකුත් ම කරන්න විදිහක් නැද්ද? මේ දරුවෝ මේ නියෝජනය කරන්නේ ශ්‍රී ලංකාව කියන රට පමණක් ම නෙවෙයි. මෙල්බන්හි ජීවත් වන ලක්ෂයකට අධික අපවත් අපේ දරු පරම්පරාවත් ඔවුන් නියෝජනය කරනවා. ඒ වෙනුවෙන් අපෙන් ඉටුවිය යුතු කොටස අපි සියළු දෙනාම කළ යුතුයි.

ඔවුන් දින දහයක් පමණ මෙහි ගත කළා. තරග කළා. දිනුවා. අර්ධ අවසාන පූර්ව තරග දක්වා පැමිණියා. නුපුරුදු රටක නුහුරු දේශගුණයක ඔවුන් තරග කළේ ප්‍රමාණාත්මක වශයෙනුත් දැවැන්තයින් සමග. තිබුණේ හිතේ ධෛර්යය පමණයි. රුපියල් අසූ දහසක් පමණ මුදලක් තමන්ම දරමින් මෙහි පැමිණි ඔවුන්ට රටතොට වත් බලන්න කාලයක් තිබුණේ නැති තරම්. තරග කාලසටහන නිසා. ඔවුන් ආවා. තරග කළා. ගියා. හරියට සිහිනයක් වගේ. ඉතිරි වුණේ මතකයක් විතරයි. කොහොම උනත් මේ රටේ ගුණ සුවඳ හඳුනන යුතුකම් දන්නා ටික දෙනකු හෝ සිටීම සතුටට කරුණක්.

19 වන පිටට

**Want to get PR...?**

Are you worried about
• Not enough points to apply for Permanent Residency?
• 60 points for occupation?

Time to contact
Hirosh H. Gamage ASA, AAIBF (Snr), MMIA
Multinational Migration Services
20/215, Betula Avenue, Mill Park, Vic 3082, Australia

On 03 94704422 or Fax 03 94704422
Or Contact Bathiya at our
Permanent Office in Sri Lanka
On 94-11-2372759

**Have you completed your course?**
**Do you have Relatives or Friends in Sri Lanka?**
**Offshore Skilled Migration Visa**



Who has one or/ and more of the following?
• A Trade Certificate/ Diploma/ Degree or Professional/ Technical Qualification?
• Have 1/3/4/6 year(s) experience in a skilled occupation or business?
• Below 45 years
• Good knowledge of English
• Blood Relative in Australia

***Business & Other Migration***
***Business Owners & Investors/ Visitors/ Spouse/ Parents/ Distinguished talent/ Remaining Relative Visa***

Student Migration
Please contact our staff at Colombo office for further details (FREE SERVICE)

**AUSTRALIAN MIGRATION SERVICES**
388, (1st Floor), Galle Road, Colombo 03
(In front of Laxshaman's Building)
Tel: 011 2372759 Fax: 011 2372759
E-mail: info@multinational.com.au

Registered Migration Agent No: 0320696

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

For More details or FREE Online Assessment Visit Our Web Site www.multinational.com.au